ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

දිනය 2014 ජනවාරි 02 වැනි දින

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 ජනවාරි**

පහළ හා ස්ථායී උද්ධමනයක් පවතින වාතාවරණයක් මධ්‍යයේ 2013 වසර මුළුල්ලේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල්කිරීම තුළින් අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රතිලාභ අත්වී ඇත. දැනට පවතින දත්ත අනුව 2013 වසර සඳහා ද.දේ.නි. යේ මූර්ත වර්ධනය සියයට 7.2 ක් පමණ වාර්තා කරනු ඇති බව පෙන්නුම්කරයි. විනිමය අනුපාතිකය සහ ජාත්‍යන්තර සංචිත තත්ත්වය සවිමත්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ගෙවුම් තුලනයෙහි වර්තන ගිණුම මෙන්ම ප්‍රාග්ධන ගිණුමද වැඩිදියුණු විය. මේ අතර, මතුපිට සහ මූලික උද්ධමනය 2013 දෙසැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත තවදුරටත් පිළිවෙළින් සියයට 4.7 සහ සියයට 2.1 දක්වා අඩු විය. මතුපිට සහ මූලික උද්ධමනයෙහි සාමාන්‍යය 2012 පැවති පිළිවෙළින් සියයට 7.6 ක් සහ සියයට 5.8 සමග සැසඳීමේදී 2013 වසරේදී පිළිවෙළින් සියයට 6.9 ක් සහ 4.4 ක් ලෙස පැවතුණි.

2012 වසර තුළ වාර්තා වූ සියයට 20.2 ක පුළුල් මුදල්හි සාමාන්‍ය වර්ධනය, 2013 වසර තුළදී සියයට 16.5 ක් දක්වා අඩු වෙමින් 2013 නොවැම්බර් මාසයේදී පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 16.7 දක්වා අඩුවිය. වෙළෙඳපොළ පොලී අනුපාතික අඩුවීම සහ ව්‍යාපාරික විශ්වාසය ඉහළයාමට ප්‍රතිචාර දක්වමින් පෞද්ගලික අංශය විසින් වාණිජ බැංකු තුළින් ලබාගත් ණය 2013 ඔක්තෝබර් මාසයේ පැවති රුපියල් බිලියන 27.2 අනුව යමින් නොවැම්බර් මාසයේ දී රුපියල් බිලියන 22.2 කින් වැඩි විය. ඒ අනුව, පෞද්ගලික අංශය විසින් දේශීය මෙන්ම ජාත්‍යන්තර

ණය සහ කොටස් වෙළෙඳපොළ ඇතුළු අනෙකුත් දේශීය මූල්‍ය ආයතනවලින් ලබාගත් ණය හරහා අරමුදල් රැස්කිරීමට අමතරව, 2013 ජනවාරි - නොවැම්බර් කාලසීමාව තුළ දී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් බිලියන 160.6 ක් විය. රාජ්‍ය සංස්ථා තෙවන අනුයාත මාසයටත් බැංකු අංශය වෙත ණය ආපසු පියවීම හේතුකොට ගෙන 2013 නොවැම්බර් මාසයේ දී රාජ්‍ය සංස්ථා වෙත ලබාදුන් ණය ප්‍රමාණය රුපියල් බිලියන 18.8 කින් අඩු විය. රජය විසින් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය ද මෙම මාසය තුළ දී අපේක්ෂා කළ පරිදි රුපියල් බිලියන 3.5 කින් අඩු විය.

විදේශීය අංශයේ, අපනයන ඉපැයීම් දෙවන අනුයාත මාසයටත් 2013 නොවැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 24.7 කින් රුපියල් බිලියනය ඉක්මවීමේ ප්‍රතිඵලයක් ලෙස 2013 ජනවාරි - නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ දී සමුච්චිත ඉපැයීම් එ.ජ.ඩොලර් බිලියන 9.4 ක් විය. සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් බිලියන 17.2 දක්වා සියයට 2.5 කින් අඩුවීම හේතුවෙන් මෙම කාලසීමාව තුළ දී සමුච්චිත වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් බිලියන 7.8 දක්වා සියයට 10.7 කින් අඩු විය. සේවා අපනයන සහ සේවා නියුක්තිකයන්ගෙන් ලද ප්‍රේෂණ ඉහළ යාම වර්තන ගිණුම තවදුරටත් සවිමත් කළ අතර, සැලකිය යුතු විදේශ ප්‍රාග්ධන ප්‍රවාහ හේතුකොටගෙන ගෙවුම් තුලනය 2012 පැවති එ.ජ.ඩොලර් මිලියන 151 ක අතිරික්තයට සාපේක්ෂව 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 700 ඉක්මවූ අතිරික්තයක් වාර්තා කළේය. විදේශ අංශයේ වර්ධන ප්‍රවණතාවන් පිළිබිඹු කරමින් 2013 අවසාන වන විට දළ නිල සංචිතය එ.ජ.ඩොලර් බිලියන 7.1 (ඇස්තමේන්තුගත) දක්වා වර්ධනය විය. ඇමරිකා එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවේ ප්‍රමාණාත්මක ලිහිල්කිරීම් අඩු කිරීමට ඇති හැකියාව පිළිබඳ ප්‍රකාශයට පත්කිරීමත් සමඟ ගෝලීය වෙළෙඳපොළෙහි පැවති කැළඹිලිවලට සාර්ථකව මුහුණ දෙමින් 2013 සැප්තැම්බර් මුල් කාලයේ සිට ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් ශක්තිමත් විය.

නව වසරේ දී ආර්ථික වර්ධනය තවදුරටත් වේගවත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර උද්ධමනය මැදි තනි අංකයක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. බැංකු අංශයෙහි ශුද්ධ විදේශ වත්කම්වල අපේක්ෂිත වැඩිදියුණු වීම, අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සහ සියයට 16 ක පමණ වන පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය වර්ධනය ඉහළයාමත් සමඟ පුළුල් මුදල් සැපයුම 2014 වසරේ දී සියයට 14 කට පමණ ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනාත්මක පීඩනයන් මැඩ පවත්වමින් අපේක්ෂිත ආර්ථික වර්ධනයන්කරා යාමට අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් සපයනු ඇත. දියුණු ආර්ථිකයන්හි අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම් සහ විදේශීය අංශය සවිමත් කිරීමට දේශීය වශයෙන් ගනු ලැබූ ව්‍යුහාත්මක ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශීය අංශය තව දුරටත් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙවැනි වර්ධනයන් සහ අපේක්ෂාවන්ට අනුව, 2013 දෙසැම්බර් මස 27 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

1. වර්තමාන පොලී අනුපාත කොරිඩෝව වෙනුවට වහාම ක්‍රියාත්මක වන පරිදි නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව පිහිටුවීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. (රූපසටහන 1) ඒ අනුව, පහත වෙනස්කම් සිදුවීමට නියමිතය:
   අ. වර්තමාන නිත්‍ය ප්‍රතිමිලදීගැනුම් පහසුකම නිත්‍ය තැන්පත් පහසුකම (SDF) ලෙසද බැංකු පද්ධතියෙහි අතිරික්ත අරමුදල් දෛනික පදනම මත තැන්පත් කිරීම සඳහා වන අනුපාතිකය නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) ලෙස ප්‍රතිනාමකරණය වනු ඇත.
   ආ. වර්තමාන නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම නිත්‍ය ණය පහසුකම (SLF)ලෙසද බැංකු පද්ධතියට දෛනික පදනම මත අරමුදල් ලබාදීමේ අනුපාතිකය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) ලෙසද ප්‍රතිනාමකරණය කරනු ඇත.
   ඇ. දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වය මත පදනම්ව විවට වෙළෙඳ කටයුතු ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා නොවෙනස්ව සිදුවනු ඇත.

2. මහ බැංකුව රටේ මුදල් අධිකාරිය වන බැවින් විවට වෙළෙඳපොළ සහභාගීවන්නන්ට සුරැකුම් සහිතව නිත්‍ය තැන්පතු පහසුකම ලබාදීම අනවශ්‍ය බව මුදල් මණ්ඩලයෙහි මතයයි. ඒ අනුව, මහ බැංකුවේ රුපියල් ගනුදෙනු සඳහා වන ශුන්‍ය ණය අවදානම සලකා බලමින්, 2014 පෙබරවාරි පළමුවැනි දින සිට බල පැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සුරැකුම් රහිතව සිදුකරන බව මුදල් මණ්ඩලය තීරණය කරන ලදී. කෙසේ වෙතත්, වර්තමානයේ පවතින පරිදි අනෙකුත් සියලුම විවට වෙළෙඳ ගනුදෙනු සුරැකුම් මත පදනම් වනු ඇත.

3 අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙහි විචලතාව සැලකිය යුතු ලෙස පහළයාමක් මුදල් මණ්ඩලයද නිරීක්ෂණය කළ බැවින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සංකෝචනය කිරීම අවශ්‍ය වන බව එහි මතය විය. ඒ අනුව, වහාම ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය පදනම් අංක 50 කින් අඩු කිරීමට මහ බැංකුව තීරණය කළ අතර, එමගින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව දැනට පවතින පදනම් අංක 200 සිට පදනම් අංක 150 දක්වා සංකෝචනය වනු ඇත. මෙම සංකෝචනය වීම තුළින් බැංකුව විසින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට පිරිනමන පොලී අනුපාතිකවලට බලපෑමක් ඇති නොවෙමින් ක්‍රමයෙන් බැංකුවල පොලී අනුපාතික අන්තරය අඩුවීමට පහසුකම් සලසනු ඇත.

රූපසටහන 1: නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව




4. 2013 අගෝස්තු 30 වැනි දින මෝටර්වාහන ආනයනයේදී වාණිජ බැංකුවල විවෘත කළයුතු ණයවර ලිපි මත වන සියයට 100 අවම මුදල් ආන්තික අවශ්‍යතාව පිළිබඳවද මුදල් මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. විදේශීය අංශයේ වර්ධනයන් පිළිබඳව සලකා බලමින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම අවශ්‍යතාව ඉවත් කිරීමට මුදල් මණ්ඩලය තීරණය කර ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේදී ප්‍රකාශයට පත්කරනු ලැබේ.